# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන)

**1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා විසින් 2023 අගෝස්තු මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 ජූලි මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[199 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි නීතිය බලපෑම වනුයේ වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව වැඩි කිරීම වේ.

## ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන)

එල්.ඩී.— ඕ. 4/2023

**1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2023 අංක    දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1979 අංක 51 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ඈ) ඡේදයේ, "රේගු අයකැමිවරයා; සහ" යන වචන වෙනුවට "රේගු අයකැමිවරයා;" යන වචන ආදේශ කරනු ලැබීමෙන්;

(2) එහි (ඉ) ඡේදයේ "නම් කරනු ලබන නියෝජිතයෙක්." යන වචන වෙනුවට "නම් කරනු ලබන නියෝජිතයෙක්; සහ " යන වචන ආදේශ කරනු ලැබීමෙන්;

(3) එහි (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් ඡේදය එකතු කරනු ලැබීමෙන්:-

"(ඊ) වරාය සහ නාවික කටයුතු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක්.".

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.